# කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# Performance Report
# 2017

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

சமுதாயஞ்சார் சீர்திருத்தத் திணைக்களம்

Department of Community Based Corrections

# කාර්යසාධන වාර්තාව

## ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

**2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා**

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

අංක 35ඒ,

ආචාර්ය ඇන්.ඇම්.පෙරේරා මාවත

බොරැල්ල

කොළඹ 08

# කොමසාරිස්තුමාගේ පණිවිඩය

සුළු වරදකරුවන්, තරුණ හා නවක වරදකරුවන් ඵලදායි පුනරුත්ථාපන ක්‍රියාවලියකට යොමු කිරිමේදී බන්ධනාගාර ගත කිරිමට වඩා ඵලදායි වනුයේ ප්‍රජා පාදක විශෝධන ක්‍රම භාවිතා කිරිම බව නූතන අපරාධ විද්‍යාඥයින්ගේ මතය වේ.

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පරමාර්ථය සුළු වරදකට දඬුවම් ලබන පුද්ගලයාට ඒ සඳහා විකල්ප අවස්ථාවන් ලබා දිමයි. ඒ තුළින් වරදක් සඳහා යොමුවන පුද්ගලයා බරපතල අපරාධකරුවෙක් වීම වලක්වනු ලැබේ. විශේෂයෙන්ම මෙම පුද්ගලයා බන්ධනාගාරගත නොකර සමාජයේ තබා ගනිමින්ම විශෝධනය කිරිම ඵලදායි වේ.

ඒ අනුව මෙම දෙපාර්තමේන්තුව නූතන සමාජයට අත්‍යාවශ්‍ය වූත් , රටට කාලින වශයෙන් වැදගත් වූත් දෙපාර්තමේන්තුවක් වේ.

.........................................

වී.ප්‍රේමචන්දිරන්

ප්‍රජා විශෝධන කොමසාරිස් (වැ.බ.)

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

**පටුන**


**01.** **හැඳින්වීම** 01-03

01.1 අරමුණු 04-05

01.2 සංවිධාන ව්‍යුහය 06-07

01.3 ශ්‍රී ලංකාවේ ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය ස්ථාපිත කිරීම 08

01.4 පනතේ විධිවිධාන 08-11

02. **විශෝධන ක්‍රියාවලිය** 12

2.1 ප්‍රජා විශෝධන ආඥා 12-22

2.2 පවත්වන ලද විවිධ විශෝධන වැඩසටහන් 23
(2016.01.01 – 2016.12.31)

2.2.1 උපදේශන හා මත් නිවාරණ වැඩසටහන් 24-25

2.2.2 සංවර්ධන හා ශ්‍රමදාන වැඩසටහන් 25-26

2.2.3 ආගමික හා අධ්‍යාත්මික සංවර්ධන වැඩ සටහන් 27-28

2.2.4 වෘත්තීය පුහුණු හා කෘෂිකාර්මික ව්‍යාපෘති 28-30

2.3 මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් වූ ප්‍රජා විශෝධන ආඥාලාභීන් විශෝධනය කිරීමේ ව්‍යාපෘතිය - වයඹ පළාත 31-36

03. **ධාරිතා සංවර්ධනය** 37

3.1 නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් හා පුහුණු කිරීමේ වැඩසටහන් 37

3.2 2016 වර්ෂයේදී ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ නිලධාරින් වෙනුවෙන් පුහුණු වැඩ සටහන් සඳහා මුදල් ගෙවීම් කර ඇති ආකාරය. 37

3.3 ව්‍යාපෘති අනුව පුනරාවර්තන හා මූලධන වියදම් 38

**04** **ඉදිරි සැලසුම්** 39

## 01. හැඳින්වීම

එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය (2013) පෙන්වා දෙන්නේ නූතන ලෝකයේ බොහෝ අධ්‍යයනය අනුව නැවත නැවත බන්ධනාගාර ගත වීමේ ප්‍රවණතාවය බන්ධනාගාරගත වීම වෙනුවට ඇති විකල්ප දඬුවම් තුළින් අඩුකළ හැකි බවය. එමෙන්ම බන්ධනාගාර ගත රැඳවියන් ප්‍රමාණය අඩු කිරීමට ද විකල්ප දඬුවම් ක්‍රම ඉවහල් වේ. බොහෝ අධිකරණ බල ප්‍රදේශ තුළ ප්‍රජා විශෝධනය සම්බන්ධ නියෝග ජනප්‍රිය වී ඇත. ඊට හේතුව එම නියෝග තුළින් පුද්ගලයා අපරාධකාරී ක්‍රියාවන් තුළින් සමාජයට කළ හානිය වෙනුවෙන් පුද්ගලයා විසින් නැවත ප්‍රජාවට අර්ථවත් යමක් සිදු කරන බැවිනි. ඒ අනුව මෙම විකල්ප දඬුවම් දඩයක් හෝ අත්හිටුවන ලද බන්ධනාගාර ගත කිරීමේ ද දඬුවමකට වඩා ප්‍රබල දඬුවමක් ලෙස සැලකේ.

මෑත කාලයේ බන්ධනාගාරගතව පුද්ගලයන් විශෝධනය කිරීම වෙනුවට ප්‍රජාව පාදක කරගත් දඬුවම් ක්‍රම තුළින් පුද්ගලයන් නිවැරදි බවට පත්කිරීම ලෝකයේ ප්‍රවණතාවක් වී ඇත (දිසානායක, 2013) . ශ්‍රී ලංකාව ද ඒ අනුව යමින් 1999 අංක 46 දරණ ප්‍රජා පාදක විශෝධන පනත ස්ථාපිත කරන ලද අතර ප්‍රජා පාදක විශෝධන ක්‍රමය නියමු ව්‍යාපෘතියක් ලෙස අධිකරණ 03 ක් ආශ්‍රිතව ආරම්භ කරන ලදී. එම නියමු ව්‍යාපෘතිය 2008 දී අධිකරණ අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තුවක් බවට පත්විය. මේ වන විට දිවයින පුරා මහේස්ත්‍රාත් අධිකරණ හා සංචාරක මහේස්ත්‍රාත් අධිකරණ 125ක ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ක්‍රියාත්මක වේ.

ප්‍රජා පාදක විශෝධන පනතට අනුව බන්ධනාගාර ගත කිරීමේ අවම දඬුවමක් නියම කිරීම අනිවාර්ය නොවන වරදක් හෝ වරද සඳහා නියමිත දණ්ඩනය අවුරුදු 02 කට වඩා අඩු බන්ධනාගාර ගත කිරීමේ වරදක් සඳහා බන්ධනාගාර ගත කිරීම වෙනුවට හෝ අත්හිටුවන ලද බන්ධනාගාර ගත කිරීමේ දඬුවමක් වෙනුවට හෝ දඩයක් නියම කිරීම වෙනුවට හෝ ප්‍රජා පාදක විශෝධන ආඥාවක් ලබාදිය හැකිය. ඒ අනුව පනතේ ප්‍රජා පාදක විශෝධන නියෝග වල අවශ්‍යතා පෙන්වා දී ඇත. එනම්

- වරදකරුගේ අපරාධකාරි චර්යාව තක්සේරු කිරීමට
- වරදකරුට ඔහුගේ මත්ද්‍රව්‍ය භාවිතය තේරුම් ගැනීමට හා ඒ සඳහා ප්‍රතිකාර හා අවශ්‍ය පියවර ගැනීමට
- වරදකරුට ඔහුගේ අපරාධකාරී චර්යාව පිළියම් යෙදීම සඳහා ඇති වැඩසටහන් වලට සහභාගී වීමට (කාර්ටර්, 1998)

වරදකරුවෙකු බන්ධනාගාර ගත වූ විට එම තත්ත්වය සමාජීයිය හා ආර්ථික වශයෙන් බලපන අතර සුළු වරදකරුවන් බන්ධනාගාරගත වීමෙන් දරුණු අපරාධකරුවන් සමඟ ඇසුර නිසා ඉදිරියේ බරපතල අපරාධකරුවන් බවට හා සමාජ විරෝධි අදහස් ඇති පුද්ගලයන් බවට පත් වේ. එමෙන්ම බන්ධනාගාර ගත වීම තුළ රැකියාව අහිමි වීමේ අවදානම හා පවුලේ ආදායම් උපයන්නා බන්ධනාගාර ගත වීම තුළ පවුලේ සාමාජිකයින්ට පිළිසරණ අහිමි වීමෙන් ඔවුන් පවුලේ නඩත්තුව සඳහා තවදුරටත් සමාජ විරෝධි ක්‍රියාවල නිරත වීමක් සිදු වේ. පාසැල් යන වයසේ දරුවන්ට පාසැල් අධ්‍යාපනය අහිමි වීමත්, ඔවුන්ට පවුලේ නඩත්තුව සඳහා දායක වීමටත් සිදු වේ. ඊට අමතරව පුද්ගලයින් බන්ධනාගාර ගත වීම තුළ රැඳවියන්ට ආහාර හා ඇඳුම් සැපයීම ඇතුළුව බන්ධනාගාර නඩත්තුව සඳහා රජයට විශාල මුදලක් වැය කිරීමට සිදුවන අතර බන්ධනාගාර තුළ තදබදය වැඩි වීමෙන් පරිපාලන ගැටළු ඇති වේ. මේ අනුව සුළු වැරදිකරුවන් ප්‍රජා පාදක විශෝධන නියෝග සඳහා යොමු කිරීම තුළ බන්ධනාගාර තදබදය අවම කිරීමත් බන්ධනාගාර නඩත්තුව සඳහා යන වියදම අවම කිරීමත් සිදු කළ හැක. මේ අනුව සුළු වරදකරුවන් සඳහා ප්‍රජා පාදක විශෝධන නියෝග ලබාදීම තුළින් එම වරදකරුවන්ගේ අපරාධකාරි චර්යාවන් නැති කළ හැකි අතර ඔහු සමාජය තුළ තබා ගනිමින් යහපත් පුරවැසියෙකු බවට පත් කළ හැක.

## දැක්ම

සුළු වරදකරුවන් සහ වරදට පෙළඹිය හැකි පුද්ගලයින් යහපත් පුද්ගලයන් බවට පත්කිරීම

## මෙහෙවර

පසු විපරමක් සහිත ඵලදායි ප්‍රජා විශෝධන ක්‍රියාවලියක් තුළින් සුළු වරදකරුවන්, වරදට පෙළඹිය හැකි පුද්ගලයින් හා ඔවුන්ගේ පවුල් ආර්ථික, සමාජීය හා අධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය කිරීම.

## අගයන්

සම්පත් උපරිම භාවිතය

නිර්මාණශීලිභාවය

කණ්ඩායම් හැගිම

නිරන්තර දියුණුව

වගවීම

## 01.1 අරමුණු

1 1999 අංක 46 දරණ ප්‍රජා පාදක විශෝධන පනත ක්‍රියාත්මක වීම මගින් සුළු වරදකරුවන් බන්ධනාගාරගත කිරීම වෙනුවට ඔවුන් ප්‍රජාව තුළ විශෝධනය කිරීම.

2 සුළු වරදකරුවන් බන්ධනාගාරගත වීම අඩුකර බන්ධනාගාර තදබදය හා ඒ සඳහා වැයවෙන රජයේ වියදම් අඩුකිරීම.

3 ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගේ ශ්‍රමය රටේ සංවර්ධනය සඳහා යොමුකර ගැනීම.

4 ප්‍රජා විශෝධන ආඥාලාභීන් මානසික, අධ්‍යාත්මික, සමාජීය හා ආර්ථික වශයෙන් සංවර්ධනය කිරීම.

5 වරදට පෙළඹිය හැකි පුද්ගලයන්ගේ හා ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගේ පවුල් ආර්ථික සමාජීය හා ආධ්‍යාත්මක වශයෙන් සංවර්ධනය කිරීම.

### කාර්යන්/සැළසුම්

1. අධිකරණ මගින් සුළු වැරදිකරුවන් වූ පුද්ගලයින් ප්‍රජා පාදක විශෝධන නියෝග සඳහා ඇතුලත් කිරීම
2. ආඥාලාභීන්ගේ අධ්‍යාපන සංවර්ධනය සඳහා ආගමික සංවර්ධන වැඩසටහන් ඇති කිරීම
3. ආඥාලාභීන්ගේ මානසික සෞඛ්‍ය වර්ධනය හා උපදේශන වැඩසටහන් ඇති කිරීම
4. ආඥාලාභීන්ගේ විශේෂ හැකියාවන් හා ජීවන තත්ත්වය නගාසිටුවීම සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
5. ආඥාලාභීන්ගේ ආර්ථික තත්ත්වය නගා සිදු වීම සඳහා විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
6. ආඥාලාභින් මත්ද්‍රව්‍ය භාවිතය වැලැක්වීම සඳහා වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීම
7. පෞරුෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

**ආයතනයේ ප්‍රමුඛතා**

1. ඵලදායී පුනරුත්ථාපන හා ප්‍රතිකාරාත්මක වැඩපිළිවෙලක් තුළින් ප්‍රජා පාදක විශෝධන ආඥාලාභීන් යහපත් පුරවැසියන් බවට පත් කිරීම
2. මානව සම්පත් සංවර්ධනය

## 01.2 සංවිධාන ව්‍යුහය



**ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2017.12.31 දිනට කාර්යය මණ්ඩලය විස්තර**

| | තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ප්‍රජා විශෝධන කොමසාරිස් | 01 | ----- |
| 2 | සහකාර කොමසාරිස්/ නියෝජ්‍ය කොමසාරිස් | 02 | 01 |
| 3 | ගණකාධිකාරි | 01 | 01 |
| 4 | ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරී | 10 | 02 |
| 5 | භාෂා පරිවර්ථක (දෙමළ) | 01 | - |
| 6 | ප්‍රජා විශෝධන නිලධාරී | 112 | 106 |
| 7 | පරිපාලන නිලධාරි | 01 | - |
| 8 | වැඩසටහන් සහකාර | 04 | 02 |
| 9 | සංවර්ධන නිලධාරී | 328 | 267 |
| 10 | තොරතුරු සන්නිවේදන සහකාර | 02 | 01 |
| 11 | ලිපිකරු/රාජ්‍ය කළමණාකරණ සහකාර | 20 | 14 |
| 12 | වැඩ පරීක්ෂක | 114 | 114<br>01 ** |
| 13 | කාර්යාල කාර්ය සහයක | 08 | 04 |
| 14 | රියදුරු | 03 | 02 |
| **එකතුව** | | **607** | **514** |

** ත්‍රස්තවාදී ප්‍රහාරයකින් මිය ගිය සේවකයෙකු සඳහා රා.ප.ච අනුව වැටුප් ගෙවනු ලැබේ.

## 01.3 ශ්‍රී ලංකාවේ ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය ස්ථාපිත කිරීම

ප්‍රජා පාදක විශෝධන ක්‍රමය 1999 වසරේදී අධිකරණ අමාත්‍යාංශයට අයත් නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කරන ලදී. 2000.02.17 ප්‍රජා පාදක විශෝධන ව්‍යාපෘතිය ආරම්භ කරන අතර එය අත්හදාබැලීමක් ලෙස මහේස්ත්‍රාත් අධිකරණ 03 කින් ආරම්භ කරන ලද අතර එනම් අළුත්කඩේ, මාලිගාකන්ද, කොටුව අධිකරණ ආශ්‍රිතව එය ආරම්භ කරන ලදී. 2003 වසරේ දී මෙය ඒකකයක් බවට පත් වූ අතර එහි සාර්ථකත්වය මත 2008.07.01 අධිකරණ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තුවක් බවට පත් කරන ලදී.

අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් 2000 වසරේ සිට වරින්වර ගැසට් නිවේදන මඟින් අධිකරණ බල ප්‍රදේශ වල ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ආරම්භ කරන දිනය පළ කරන ලදී. ඒ අනුව ආරම්භයේ දී කොළඹ සහ කොටුව අධිකරණ බල ප්‍රදේශ ද, 2001 වසරේ දී අධිකරණ බල ප්‍රදේශ 03 ක් ද, 2005 වසරේදී අධිකරණ බල ප්‍රදේශ 05 ක් ද, 2007 වසරේ දී අධිකරණ බල ප්‍රදේශ 32 ක් ද වශයෙන් අධිකරණ තුළ මෙම ක්‍රියාවලිය ව්‍යාප්ත කිරීම සමඟ ප්‍රසිද්ධ කරන ලදී. වර්තමානයේ මෙම ක්‍රියාවලිය මහේස්ත්‍රාත් අධිකරණ හා සංචාරක අධිකරණ 125 ක ක්‍රියාත්මක වේ.

## 01.4 පනතේ විධිවිධාන

1999 අංක 46 දරණ ප්‍රජා පාදක විශෝධන පනත මඟින් බන්ධනාගාර ගත කිරීම වෙනුවට ප්‍රජා පාදක විශෝධන නියෝග අධිකරණ මඟින් ලබා දීම සඳහා නිතිමය ප්‍රතිපාදන සකස් කරන ලදී. එම පනතෙහි 5(1) වගන්තියෙහි දැක්වෙන ආකාරයට ප්‍රජා පාදක විශෝධන ආඥාවක් නිකුත් කළ හැක්කේ බන්ධනාගාර ගත කිරීම අනිවාර්ය නොවන සහ නියම කළ හැකි බන්ධනාගාරගත කිරීමේ කාල සීමාව අවුරුදු 2 ක් නොඉක්මවන වරදවල් සඳහා පමණි. ඒ අනුව බන්ධනාගාර ගත කිරීමේ අත්හිටුවන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් වෙනුවට හෝ දඩයක් නියම කිරීම වෙනුවට ප්‍රජා පාදක විශෝධන ආඥාවකට වරදකරු ඇතුළත් කළ හැක.

**කොමසාරිස්වරයාගේ කර්තව්‍ය - (4 වන වගන්තිය)**

(අ) මේ පනතේ කාර්ය සඳහා පිහිටුවන ලද ප්‍රජා විශෝධන මධ්‍යස්ථාන විෂයෙහිද , ප්‍රජා පාදක විශෝධන නියෝජ්‍ය කොමසාරිස්වරයන් හා ප්‍රජා පාදක විශෝධන සහකාර කොමසාරිස්වරයන් විෂයෙහිද, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ අනෙක් නිලධරයන් විෂයෙහි ද පාලනය ක්‍රියාත්මක කිරීම

(ආ) ප්‍රජා පාදක විශෝධන ආඥා ක්‍රියාත්මක කිරීම සඳහා උචිත මණ්ඩල සමඟ වැඩ කටයුතු පිළියෙල කිරීම

(ඇ) ප්‍රජා පාදක විශෝධන ආඥා සඳහා වරදකරුවන්ගේ යෝග්‍යතාවය සම්බන්ධයෙන් අධිකරණවලට උපදෙස් දීම

(ඈ) ප්‍රජා පාදක විශෝධන ආඥා ක්‍රියාත්මත කිරීම සඳහා පවත්නා පහසුකම් නිසැකව දැන ගැනීම , ඒ පහසුකම් හඳුනා ගැනීම හා ඒ පිළිබඳව අධිකරණවලට උපදෙස් දීම

(ඉ) අධිකරණය විසින් ඇතුලත් කිරීමට යෝජිත ප්‍රජා පාදක විශෝධන ආඥාවක් හා සම්බන්ධ කළ යුතු ඉතාම උචිත වැඩසටහන හෝ විශේෂ කොන්දේසිය සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම

(ඊ) ප්‍රජා පාදක විශෝධන ආඥා ඇතුලත් කර ඇත්තේ යම් වරදකරුවන් සම්බන්ධයෙන් ද ඒ වරදකරුවන් නියාමනය කිරීම , ඔවුන් ප්‍රවීක්ෂණය කිරීම හා අධීක්ෂණය කිරීම.

(උ) 14 වන වගන්තිය යටතේ නඩු පැවරීමේ අදහස ඇතිව , ප්‍රජා පාදක විශෝධන ආඥාවක යම් කොන්දේසියක් අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම පිළිබඳව අධිකරණයට දැනුම් දීම

(ඌ) අවශ්‍ය අවස්ථාවකදි , ප්‍රජා පාදක විශෝධන ආඥාවක් වෙනස් කරන ලෙස ඉල්ලා සිටීම

(එ) විශෝධන මූලධර්ම , අරමුණු හා වැඩසටහන් සම්බන්ධයෙන් ප්‍රජා අධ්‍යාපනය ලබාදීමට සැලසීම.

**ප්‍රජා විශෝධන ආඥාවල කොන්දේසි (9 වන වගන්තිය)**

**(1) සෑම ප්‍රජා පාදක විශෝධන ආඥාවක්ම නියමිත ආකෘතියෙහි විය යුතු අතර , එහි පහත සඳහන් කොන්දේසි ඇතුලත් විය යුතුය :-**

(අ) වරදකරු කිරීමේදී බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය හැකි වෙනත් වරදක් ආඥාවේ කාල සීමාව තුලදී , වරදකරු විසින් කරනු නොලැබිය යුතු බව ;

(ආ) ආඥාවේ දින සිට පැය හැත්තෑ දෙකක් ඇතුළත වරදකරු නිශ්චිත ප්‍රජා විශෝධන මධ්‍යස්ථානයක් වෙත වාර්තා කළ යුතු බව ;

(ඇ) ප්‍රජා විශෝධන මධ්‍යස්ථාන භාර නිලධාරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන දිනවලදී ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ නිලධරයෙකු වෙත වරදකරු වාර්තා කළ යුතු බව හා ඒ නිලධරයා වරදකරු බැලීමට පැමිණෙන බව ;

(ඈ) වරදකරුගේ ලිපිනයෙහි, සේවා නියුක්තියෙහි හෝ රැකියාවෙහි හෝ යම් වෙනස් වීමක් ඒ වෙනස් වීම සිදු වීමට යටත් පිරිසෙන් දින හතකට පෙර, වරදකරු විසින් ආඥාවේ නිශ්චිතව සඳහන් ප්‍රජා විශෝධන මධ්‍යස්ථානය භාර නිලධරයා වෙත දැනුම් දිය යුතු බව.

(ඉ) ආඥාවේ නිශ්චිතව සඳහන් ප්‍රජා විශෝධන මධ්‍යස්ථානය භාර නිලධරයා විසින් සාමාන්‍යයෙන් හෝ යම් විශේෂ අවස්ථාවකට අදාලව දෙනු ලබන අවසරයක් වන අවසරය ඇතිව හැර , වරදකරු නිශ්චිත ප්‍රදේශයකින් බැහැර නොයන බව ,

(ඊ) 2 වන වගන්තිය යටතේ පත් කරන ලද නිලධරයන් විසින් නිකුත් කරනු ලබන සියළු නීත්‍යානුකූල රීතිවලට, උපදෙස්වලට හා විධිවිධාන වලට වරදකරු අවනත වන බව.

**(2) (අ) වරදකරුගේ සාපරාධී හැසිරීම කෙරෙහි දායක වූ පෞද්ගලික සාධක කිසිවක් තක්සේරු කිරීම හැකි කිරීමේ;**

(ආ) ඒ සාධක හඳුනා ගැනීමට, ඒවා පාලනය කිරීමෙහි ලා පියවර ගැනීමට සහ අවශ්‍ය වන්නේ නම් ඒවා සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට වරදකරුට අවස්ථාවක් ලබා දීමේ ; සහ

(ඇ) ස්වකීය සාපරාධී හැසිරීම කෙරෙහි කෙලින්ම අදාල ක්ෂේත්‍රයන්හි අඩුලුහුඬුකම් ඇති වරදකරුවෙකුට, ඒ අඩුලුහුඬුකම්වලට පිළියම් යෙදීම සඳහා සැළසුම් කර ඇති වැඩසටහන් වලට සහභාගී වීමේ ,

කාර්ය සඳහා අධිකරණය විසින් , ප්‍රජා පාදක විශෝධන ආඥාවකට පහත සඳහන් කොන්දේසි එකක් හෝ වැඩි ගණනක් ඇතුලත් කරනු ලැබිය හැකිය :-

i. ආඥාවේ නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රජා විශෝධන මධ්‍යස්ථාන භාර නිලධරයා විසින් විධාන කරනු ලබන පරිදි වූ ගෙවීමක් කරනු නොලබන ප්‍රජා වැඩ , අධිකරණය විසින් නිශ්චිත කරනු ලබන කාලයක් සඳහා වරදකරු විසින් ඉටු කරනු ලබන බව,

ii. වරදකරු, කොමසාරිස්වරයා විසින් නම් කරනු ලබන ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ නිලධරයකුගේ අධීක්ෂණය යටතේ සිටිය යුතු බව ;

iii. අධිකරණය විසින් නිශ්චය කරනු ලබන හා කොමසාරිස්වරයා විසින් විධාන කරනු ලබන අධ්‍යාපනික, වෘත්තීයමය හා පෞද්ගලික පුහුණුවීම් හා සංවර්ධන වැඩසටහන් වලට වරදකරු සහභාගී වන බව; ස්වකීය සාපරාධි හැසිරීම කෙරෙහි කෙලින්ම අදාල ක්ෂේත්‍රයන්හි දැඩි අඩුලුහුඬුකම් ඇති වරදකරුවෙකුට , ඒ අඩුලුහුඬුකම්වලට පිලියම් ලබා දෙන වැඩසටහන්වලට සහභාගී වන ලෙස නියම කරනු ලැබිය හැකි බව;

iv. අධිකරණය විසින් විධානය කරනු ලබන පරිදි , වරදකරු මධ්‍යසාර හෝ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම පිළිබඳ තක්සේරුවකට භාජනය විය යුතු බව හා ඒ සඳහා ප්‍රතිකාර ලබා ගත යුතු බව හෝ ඔහු වෛද්‍ය , මානසික හෝ මනෝ චිකිත්සක තක්සේරුවකට හා ප්‍රතිකාර ලබා ගැනීමකට භාජනය විය යුතු බව ;

v. ආඥාවේ නිශ්චිතව සඳහන් ප්‍රජා විශෝධන මධ්‍යස්ථානය භාර නිලධරයා විසින් විධානය කරනු ලබන පරිදි , මද්‍යසාර හෝ මත්ද්‍රව්‍ය භාවිතය පරීක්ෂා කිරීම සඳහා වරදකරු ඉදිරිපත් වන බව ;

vi. ආඥාව ඇතුලත් කරනු ලබන්නේ යම් කාර්ය සඳහා ද ඒ කාර්ය සැලකිල්ලට ගෙන , අධිකරණය විසින් අවශ්‍ය හෝ යෝග්‍ය යයි සලකනු ලබන වෙනත් යම් කොන්දේසියක්.

# 02. විශෝධන ක්‍රියාවලිය

## 2.1 ප්‍රජා විශෝධන ආඥා

| පළාත | වරදකරුවන් සංඛ්‍යාව |
|---|---|
| බස්නාහිර | 5161 |
| මධ්‍යම | 876 |
| දකුණ | 2390 |
| උතුර | 1655 |
| නැගෙනහිර | 656 |
| වයඹ | 1721 |
| උතුරු මැද | 306 |
| ඌව | 420 |
| සබරගමුව | 1139 |
| **එකතුව** | **14324** |



ඉහත ප්‍රස්ථාරයට අනුව වැඩිම ආඥාලාභීන් ප්‍රමාණයක් බස්නාහිර පළාතට අයත්ය. අඩුම ආඥාලාභීන් ප්‍රමාණය උතුරු මැද පළාතින් ලැබී ඇත. මධ්‍යම පළාතට අයත් ආඥාලාභීන් ප්‍රමාණය ඌව පළාතට අයත් ආඥාලාභීන් ප්‍රමාණය මෙන් දෙගුණයකි. දකුණ, හා වයඹ පළාත් වලට අයත් ආඥාලාභීන් ප්‍රමාණය ඉහළ අගයක් ගනී.

| **වරදේ ස්වභාවය** | **එකතුව** | **ප්‍රතිශතය (%)** | |
|---|---|---|---|
| හෙරොයින් | 2983 | 20.83 | |
| ගංජා | 1813 | 12.66 | 64.92% |
| නීතිවිරෝධි මත්පැන් | 4503 | 31.44 | |
| මහජන පීඩා | 1473 | 10.28 | |
| හොරකම | 517 | 3.61 | |
| රැවටීම | 38 | 0.27 | |
| නීති විරෝධි අවි | 9 | 0.06 | |
| සොරබඩු ලඟතබා ගැනීම | 27 | 0.19 | |
| සූදුව | 1218 | 8.50 | |
| කෝලාහල | 63 | 0.44 | |
| වෙනත් | 1680 | 11.73 | |
| එකතුව | **14324** | **100.00** | |

මෙම ආඥාලාභීන්ගෙන් 65% පමණ නීතිවිරෝධි මත්පැන්, හෙරොයින් හෝ ගංජා සඳහා ඇබ්බැහි වූවන් වේ.




ඉහත ප්‍රස්ථාරයට අනුව වැඩිම ආඥාලාභීන් ප්‍රමාණයක් විවාහකයන් වන අතර විවාහක ආඥාලාභීන් ප්‍රමාණය මුළු ආඥාලාභීන්ගෙන් 68% ප්‍රමාණයකි. මේ අනුව පවුලේ ආදායම් උපයානන්නා (බිරිද හෝ සැමියා) බන්ධනාගාරගත වීම නිසා ඔවුන්ගෙන් යැපෙන්නන් සාමාජීය හා ආර්ථීක වශයෙන් දැඩි පීඩනයකට ලක් වේ. එබැවින් පවුලේ සාමාජිකයින්ගේ නඩත්තුව සඳහා බිරිඳ හෝ සැමියා අපරාධ කිරීමට පෙළෙඹීමට ඉඩ ඇත.




ඉහත තොරතුරු අනුව බහුතරයක් ආඥාලාභීන් පිරිමි වන අතර ඉතාම අඩු සංඛ්‍යාවක් කාන්තාවන් වේ. ඒ අනුව පුරුෂයන් බහුතරයක් අපරාධ සම්බන්ධව අධිකරණයෙන් වරදකරුවන් වී ඇති බව පෙනේ.




ඉහත ප්‍රස්ථාරයට අනුව බහුතර ආඥාලාභීන් ප්‍රමාණය 7-9 වසර දක්වා පාසැල් අධ්‍යාපනය ලබා ඇත. 2017 වසරේ දී 24.8% වේ. දෙවනුව අ.පො.ස(සා/පෙළ) දක්වා පාසැල් අධ්‍යාපනය ලැබූ අය වේ (23.2%). අ.පො.ස(උ/පෙළ) දක්වා අධ්‍යාපන ලැබූ ප්‍රමාණය ඉතා අඩු අගයක් ගනී. එය 2017 වසරේදී 5.1% කි. 2017 වසරේ දී පාසැල් නොගිය ආඥාලාභීන් සංඛ්‍යාව මුළු ආඥාලාභීන්ගේ 6.7% වේ. ඉහත සංඛ්‍යා ලේඛන අනුව අපො.ස(සා/පෙළ) ට වඩා අඩු අධ්‍යාපනයක් ලැබූ ප්‍රමාණය 71.7% වේ. ඒ අනුව ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගෙන් බහුතරය අඩු අධ්‍යාපනයක් ලැබූ අය වේ. මින් පැහැදිළි වන්නේ අඩු අධ්‍යාපනයක් ලැබූ පිරිස අපරාධකාරී චර්යා සඳහා පෙළඹී ඇති බවයි.



2017 සංඛ්‍යා ලේඛන අනුව බහුතර අඥාලාභීන් ප්‍රමාණයක් කම්කරුවන් වන අතර දෙවනුව තාවකාලික රැකියාවල නිරත වන අය වේ. 2017 වසරේදී රැකියා විරහිත පිරිසට වඩා රැකියාවක නියුතු ප්‍රමාණය වැඩිය. ස්ථිර රැකියාකව නියුතු ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස 15% කි. බහුතර ආඥාලාභීන් ප්‍රමාණයක් කම්කරුවන් වන අතර තාවකාලික රැකියාවල නියුතු අය හා රැකියා විරහිත ප්‍රමාණය පිළිවෙලින් 56%, 25%, 4% වේ. කෙසේ වෙතත් මෙම ප්‍රමාණය ඉහළ අගයක් ගන්නා අතර එය 85% වේ. මේ අනුව නිසා ආර්ථික තත්ත්වයක් සමාජ තත්ත්වයක් නොමැති අය වැරදි සඳහා පෙළඹීමේ ප්‍රවණතාවයක් පවතින බව පෙනේ.




ඉහත ප්‍රස්ථාරයට අනුව බොහෝ අඥාලාභීන් වයස් කාණ්ඩ 23-32 ට අයත් වේ. ඒ අනුව පැහැදිළි වන්නේ බොහෝ තරුණ පිරිස සම කණ්ඩායම් වල බලපෑම නිසා හා නිසි රැකියාවන් නොමැති වීම නිසාත් අපරාධ සඳහා පෙළෙඹවෙන බවයි. තවදුරටත් වයස් කාණ්ඩ 18-22, 23-32,33-37,38-42 සැලකිය යුතු මට්ටමින් අපරාධ කිරීම් සම්බන්ධව ඉහළ අගයක් ගන්නා අතර මෙම ආඥාලාභීගේ අපරාධකාරී හැසිරීම් සමාජයේ ආර්ථික, සමාජීය හා අධ්‍යාත්මික වර්ධනය කෙරෙහි සැලකිය යුතු අන්දමින් බලපායි.




2017 වසරේ සංඛ්‍යා ලේඛන අනුව ප්‍රජා පාදක විශෝධන ආඥා බහුතරයක් ලැබී ඇත්තේ බස්නාහිර පළාතෙනි. එමෙන්ම හෙරොයින් සම්බන්ධ ආඥා බහුතරයක් ලැබී ඇත්තේ බස්නාහිර පළාතෙනි. තවදුරටත් එම ආඥා ප්‍රමාණය වසරින් වසර වර්ධනය වේ. 2016 වසරේ දී නීත්‍යානුකූල නොවන මත්පැන් සඳහා බහුතරයක් ආඥා ලැබී ඇති අතර 2017 වසරේ දී හෙරොයින් සඳහා බහුතර ආඥා ප්‍රමාණයක් ලැබී ඇත. තවදුරටත් 2017 වසරේ දී සොරකම් සම්බන්ධ වැරදි සඳහා ලබා දී ඇති ආඥා ප්‍රමාණය වර්ධනය වී ඇත.



2016, 2017 වසර වල මධ්‍යම පළාත තුළ නීතිවිරෝධි මත්පැන් සඳහා බහුතර ආඥා ප්‍රමාණයක් ලැබී ඇත . තවදුරටත් 2016 හා 2017 වසර වල මධ්‍යම පළාත තුළ මහජන පීඩා සම්බන්ධ ආඥා විශාල ප්‍රමාණයක් ද ලැබී ඇත.




2016, 2017 වසර වල ඌව පළාත තුළ නීතිවිරෝධි මත්පැන් සඳහා බහුතර ආඥා ප්‍රමාණයක් ලැබී ඇත. ගංජා සඳහා සැලකිය යුතු මට්ටමින් ඉහළ ආඥා ප්‍රමාණයක් ලැබී ඇති අතර එම ප්‍රදේශ වල ගංජා වගා කිරීම මීට හේතු විය හැක.



2016, 2017 වසර වල දකුණු පළාත තුළ නීතිවිරෝධි මත්පැන් සඳහා බහුතර ආඥා ප්‍රමාණයක් ලැබී ඇත. තවදුරටත් 2016 හා 2017 වසර වල දකුණු පළාත තුළ මහජන පීඩා සම්බන්ධ ආඥා විශාල ප්‍රමාණයක් ද ලැබී ඇත.




2016, 2017 වසර වල සබරගමුව පළාත තුළ නීතිවිරෝධි මත්පැන් සඳහා බහුතර ආඥා ප්‍රමාණයක් ලැබී ඇත. තවදුරටත් 2016 හා 2017 වසර වල සබරගමුව පළාත තුළ සූදු සෙල්ලම් කිරීම හා අනෙකුත් වැරදි වලට වඩා වැඩි වශයෙන් පවතී.



මෙම පළාත තුළ මහජන පීඩා සම්බන්ධ වැරදි ඉහළ අගයක් ගන්නා අතර නීති විරෝධි පත්පැන් සම්බන්ධ වැරදි ද ඉහළ අගයක් ගනී.




මෙම පළාත තුළ නීතිවිරෝධි මත්පැන් සම්බන්ධ වැරදි ඉහළ අගයක් ගන්නා අතර එය අනෙකුත් පළාත් වලට සාපේක්ෂකව ඉහළ අගයක් ගනී .




මෙම පළාත තුළ නීතිවිරෝධි මත්පැන් සඳහා වැරදි ඉහළ අගයක් ගනී. ගංජා හා මහජන පීඩා සම්බන්ධ වැරදි සමාන මට්ටමින් සිදු වී ඇත.




මෙම පළාත තුළ වෙනත් කාණ්ඩයට අයත් වැරදි ඉහළ අගයක් ගන්නා බව ඉහත ප්‍රස්ථාරය අනුව පෙනී යයි. මහජන පිඩා සම්බන්ධ වැරදි සැලකිය යුතු මට්ටමින් ඉහළ අගයක් ගනී.

**2017**

**14324** ප්‍රජා විශෝධන නියෝග ලැබූ ආඥාලාභීන් සංඛ්‍යාව

**2252** උපදේශන වැඩසටහන්

176 අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන්

**156** වෘත්තීය පුහුණු වැඩසටහන්

**850** ගෙවීමක් නොකරන ප්‍රජා වැඩ හා ශ්‍රමදාන වැඩසටහන්

**45** ආදායම් උත්පාදන වැඩසටහන්

**2280** වෛද්‍ය ප්‍රතිකාර

## 2.2 පවත්වන ලද විවිධ විශෝධන වැඩසටහන් - (2017.01.01 – 2017.12.31)

ප්‍රජා විශෝධන ආඥාලාභීන් වෙනුවෙන් උපදේශන හා මත්නිවාරණ, අධ්‍යාත්මික සංවර්ධන හා වෘත්තීය පුහුණු වැඩසටහන් පවත්වා ඇති අතර ඔවුන් සම්බන්ධ කරගනිමින් ශ්‍රමදාන වැඩසටහන් රැසක් සාර්ථකව දිවයින පුරා අධිකරණ මට්ටමින් ක්‍රියාත්මක කර ඇත.

| වැඩසටහන | සංඛ්‍යාව |
|---|---|
| උපදේශන | 2252 |
| ශ්‍රමදාන | 850 |
| ආගමික හා අධ්‍යාත්මික | 176 |
| වෘත්තීය පුහුණු | 156 |
| වෛද්‍ය ප්‍රතිකාර (යොමු කල ගණන) | 2280 |
| විශේෂ දින වැඩසටහන් | 55 |

### පවත්වන ලද විවිධ විශෝධන වැඩසටහන්



## 2.2.1 උපදේශන හා මත් නිවාරණ වැඩසටහන්

ප්‍රාදේශීය කාර්යාල මගින් 2017.12.31 දක්වා මත්නිවාරණ හා උපදේශනාත්මක වැඩසටහන් සිදුකර ඇත. එය පළාත් අනුව පහත පරිදි දැක්විය හැකිය.

| පළාත | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|
| බස්නාහිර | 620 |
| මධ්‍යම | 67 |
| දකුණ | 354 |
| උතුර | 360 |
| නැගෙනහිර | 175 |
| වයඹ | 165 |
| උතුරු මැද | 98 |
| ඌව | 98 |
| සබරගමුව | 315 |
| **එකතුව** | **2252** |



## උපදේශන හා මත් නිවාරණ වැඩසටහන්



උපදේශන වැඩසටහන- බණ්ඩාරවෙල ප්‍රජා විශෝධන කාර්යාලය



කණ්ඩායම් උපදේශන වැඩසටහන කැකිරාව ප්‍රජා විශෝධන කාර්යාලය





මත්නිවරණ දැනුවත් කිරීමේ වැඩසටහන් - බද්දේගම ප්‍රජා විශෝධන කාර්යාලය

## 2.2.2 සංවර්ධන හා ශ්‍රමදාන වැඩසටහන්

ප්‍රාදේශීය කාර්යාල මගින් ප්‍රජා විශෝධන ආඥාලාභීන් යොදවා ඩෙංගු මර්ධන ශ්‍රමදාන වැඩසටහන්, පාසල් ගොඩනැගිලි හා විහාරස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ශ්‍රමදාන වැඩසටහන් පවත්වා ඇත. පළාත් මට්ටමින් පහත පරිදි එය දැක්විය හැක.

| පළාත | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|
| බස්නාහිර | 178 |
| මධ්‍යම | 64 |
| දකුණ | 103 |

| | |
|---|---|
| උතුර | 119 |
| නැගෙනහිර | 65 |
| වයඹ | 62 |
| උතුරු මැද | 27 |
| ඌව | 99 |
| සබරගමුව | 133 |
| **එකතුව** | **850** |






ශ්‍රමදාන වැඩසටහන- මොණරාගල ප්‍රජා විශෝධන කාර්යාලය



ශ්‍රමදාන වැඩසටහන- මඩකලපුව ප්‍රජා විශෝධන කාර්යාලය

## 2.2.3 ආගමික හා අධ්‍යාත්මික සංවර්ධන වැඩ සටහන්

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව යටතේ විවිධ ආගමික හා අධ්‍යාත්මික සංවර්ධන වැඩ සටහන් සිදු කිරීම.

| පළාත | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|
| බස්නාහිර | 39 |
| මධ්‍යම | 5 |
| දකුණ | 19 |
| උතුර | 10 |
| නැගෙනහිර | 28 |
| වයඹ | 22 |
| උතුරු මැද | 14 |
| ඌව | 14 |
| සබරගමුව | 25 |
| **එකතුව** | **176** |





ආගමික හා අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන
බද්දේගම ප්‍රජා විශෝධන කාර්යාලය



ආගමික හා අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන
මන්නාරම ප්‍රජා විශෝධන කාර්යාලය



ආගමික හා අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන්
පේදුරුතුඩුව ප්‍රජා විශෝධන කාර්යාලය



ආගමික හා අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන්
මාතර ප්‍රජා විශෝධන කාර්යාලය

## 2.2.4. වෘත්තීය පුහුණු හා කෘෂිකාර්මික ව්‍යාපෘති

දිවයිනේ සියලුම ප්‍රාදේශීය කාර්යාලයන්හි මේ වන විට ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගේ ශ්‍රමය යොදාගනිමින් කෘෂිකාර්මික හා නිෂ්පාදන ව්‍යාපෘති සිදුකරමින් පවතී. ආකල්ප සංවර්ධනය මෙන්ම පවුලේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ඔවුන් නැඹුරු කරලීම ප්‍රධානතම අරමුණ වන අතර නිෂ්පාදන අලෙවියෙන් ලැබෙන ආදායම රජයේ ආදායමට බැර කිරීම තුළින් රටේ සංවර්ධනයට ද දායක කරවා ගනී.





ප්‍රජා විශෝධන කාර්යාලය - මාතර

ප්‍රජා විශෝධන කාර්යාලය - හොරණ

## ආඥාලාභීන් සඳහා විශෝධන වැඩසටහන් හා පුහුණු වැඩසටහන්



ප්‍රජා විශෝධන කාර්යාලය- කොටුව



ප්‍රජා විශෝධන කාර්යාලය- පානදුර




ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - කිරින්ද - පුහුල්වැල්ල



ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - බමුණුකොටුව

## 2.3 මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරැදිකරුවන් වූ ප්‍රජා විශෝධන ආඥාලාභීන් විශෝධනය කිරීමේ ව්‍යාපෘතිය - වයඹ පළාත

### පසුබිම

වයඹ පළාත තුළ පසුගිය වසර 05ක තුළ, නීති විරෝධී මත් පැන් සඳහා පුද්ගලයින් 10,565 ක්, ගංජා සඳහා පුද්ගලයින් 460ක් හා හෙරොයින් සඳහා පුද්ගලයින් 180ක් සඳහා ප්‍රජා පාදක විශෝධන නියෝග ලබා දී ඇත. 2016 වසරේ වයඹ පළාත තුළ ප්‍රජා පාදක විශෝධන නියෝග ලැබූ සමස්ථ ආඥාලාභීන් සංඛ්‍යාව 1382 ක් වන අතර ඉන් 1305ක් (94.4%) මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා ආඥා ලැබූවන් වේ. ශ්‍රී ලංකාවේ පළාත් වශයෙන් ගත් විට මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා වැඩිම වරදකරුවන් ප්‍රමාණයකට ප්‍රජා පාදක විශෝධන නියෝග ලබා දී ඇත්තේ වයඹ පළාතෙනි. එබැවින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වයඹ පළාත තෝරා ගන්නා ලදි.

මත් ද්‍රව්‍ය භාවිතා කරන වරදකරුවන් සඳහා විශෝධන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමේදී මත් නිවාරණ ප්‍රතිකාර සැලැස්මකින් පසුව එය ක්‍රියාත්මක කළ යුතු බව හඳුනාගෙන ඇති අතර මෙලෙස ප්‍රතිකාර සැලැස්මක් අවශ්‍ය වන්නේ දීර්ඝ කාලයක් මත් ද්‍රව්‍ය භාවිතා කිරීම නිසා ඒ සඳහා ඇබ්බැහි වූ තැනැත්තන් ඉන් මුදවා ගැනීම මූලික කාරණයක් වන බැවින්ද, එසේ ප්‍රතිකාර සැලැස්මකින් තොරව එවැනි වරදකරුවන් විශෝධනය කිරීම නිරර්ථක ක්‍රියාවක් බැවින්ය. විශේෂයෙන්ම හෙරොයින් වැනි මත්ද්‍රව්‍ය භාවිතා කරන වරදකරුවන් විශෝධනය කිරීම සඳහා විශේෂ වූ වැඩපිළිවෙලක් අවශ්‍ය වන අතර ඒ සඳහා ප්‍රතිකාර සැලැස්මක් මෙන්ම උපදේශන ක්‍රියාවලියක්ද ක්‍රියාත්මක කල යුතු වේ.

වගුව : 02 වර්ෂ 2016 දී මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා ලබා දී ඇති ප්‍රජා පාදක විශෝධන නියෝග පිළිබඳ තොරතුරු

| පළාත | වරද අනුව නියෝග ගණන | | | මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා ලැබුණු මුළු නියෝග | වසර තුළ ලැබුණු මුළු නියෝග | මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා ලැබුණු නියෝග ප්‍රතිශතය(%) |
|---|---|---|---|---|---|---|
| | හෙරොයින් | නීති විරෝධී මත්පැන් | ගංජා | | | |
| වයඹ | 17 | 1239 | 49 | 1305 | 1382 | 94.4 |
| බස්නාහිර | 1654 | 2160 | 547 | 4361 | 4837 | 90.1 |
| උතුරු මැද | 3 | 198 | 46 | 247 | 337 | 73.2 |
| ඌව | 14 | 198 | 56 | 268 | 391 | 68.5 |
| සබරගමුව | 28 | 588 | 79 | 695 | 1040 | 66.8 |
| මධ්‍යම | 32 | 533 | 114 | 679 | 1207 | 56.2 |
| දකුණ | 149 | 822 | 160 | 1131 | 2186 | 51.7 |
| නැගෙනහිර | 12 | 244 | 110 | 366 | 861 | 42.5 |
| උතුර | 6 | 259 | 272 | 537 | 1711 | 31.4 |

(මූලාශ්‍රය:-ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව)

**ව්‍යාපෘතියේ අරමුණු**

- ❖ වයඹ පළාත තුළ මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහි වූ ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගෙන් 70%ක් ඉන් මුදවා ගැනීම

- ❖ වයඹ පළාත තුළ මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහි වූ ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගෙන් තෝරාගත් පවුල් 750ක ආර්ථිකය ශක්තිමත් කිරීම

## ව්‍යාපෘතියේ උපායමාර්ග

- ❖ මත්ද්‍රව්‍ය සඳහා වැය කරනු ලබන මුදල්, පවුලේ සාමාජිකයන්ගේ අවශ්‍යතා සඳහා යෙදවීම මඟින් ඔවුන් සාමාජීය වශයෙන් උසස් මට්ටමකට ගෙන ඒම

- ❖ මත්ද්‍රව්‍ය භාවිතයට ගැනීම හා භාවිතා කිරීමට වැය කරන කාලය වෙනත් කාර්යක් සඳහා යෙදවීම හරහා සමාජයේ අත්‍යාවශ්‍ය පුද්ගලයකු බවට පත් කිරීම (ආර්ථික කටයුතු /ආගමික කටයුතු/ පවුලේ සාමාජිකයන් සමඟ විනෝදවීම/ සමාජ සේවා කටයුතු යනාදිය සඳහා යොමු කිරීම)

- ❖ මත්ද්‍රව්‍ය භාවිතයෙන් ඉවත් කර ගැනීම තුළින් සෞඛ්‍ය සම්පන්න පුද්ගලයින් ලෙසත්, පවුලේ සාමාජිකයන් අතර වගකීම් දරණ පුද්ගලයකු බවට පත් කිරීම හා පවුල තුළ පවතින බැඳීම වඩාත් තහවුරු කිරීම.

- ❖ වයඹ පළාත තුළ පිහිටි මහේස්ත්‍රාත් අධිකරණ 14ක ප්‍රජා විශෝධන නිලධාරීන් 15කු සේවයේ යොදවා ඇති අතර ආඥාලාභීන්ගේ ප්‍රජා වැඩ අධීක්ෂණය හා කාර්යාල කටයුතු සඳහා සහය වීමට මෙම කාර්යාල සඳහා වැඩ පරීක්ෂකවරු 12ක් අනුයුක්ත කර ඇත. එමෙන්ම වයඹ පළතේ කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 42ක් සඳහා සංවර්ධන නිලධාරීන් 42ක් අනුයුක්ත කර ඇත. මෙම නිලධාරීන් සියලු දෙනාම විශෝධන ක්‍රියාවලියට දායක කරගත හැකි පරිදි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

- ❖ ආඥාලාභීන්ගෙන් වැඩි ප්‍රමාණයක් නීති විරෝධී මත්පැන් සම්බන්ධ වැරදි සඳහා ප්‍රජා පාදක විශෝධන නියෝග ලබා ඇති අතර ඔවුන්ගෙන් 53.5%ක් වයස අවුරුදු 18 - 40ත් අතර පුද්ගලයන් වේ .මෙවැනි වරදකරුවන් සාර්ථකව විශෝධනය කර නිසි වෘත්තීය මාර්ගෝපදේශන හා කළමනාකරණ හැකියාව වර්ධනය කිරීම, ප්‍රජා විශෝධන නිලධාරී සහ

සංවර්ධන නිලධාරී විසින් සිදුකරන ලද අතර එමගින්, ඔවුන්ගේ ජීවිත වඩා යහපත් කරගැනීමට අවස්ථාව සලසා දී ඇත. මෙම ආඥාලාභීන්ගෙන් 10.8% කට රැකියාවක් නොමැති අතර 86.7%ක් දෛනික හෝ තාවකාලික රැකියාවන්හි නිරත වන පුද්ගලයන් වන බැවින් ඔවුන් ආර්ථික වශයෙන් සංවර්ධනය කිරීම සඳහා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදි .මෙම ආඥාලාභීන්ගේ අධ්‍යාපන තත්වය ඉතා අවම මට්ටමක පැවතීම, විධිමත් රැකියාවක් සඳහා යොමු නොවීමත් මත තාවකාලිකව මුදල් ඉපයිය හැකි රැකියාවන්හි නිරත වීමටත්, මත්ද්‍රව්‍ය භාවිතය හා ඒ ආශ්‍රිත වැරදි සිදු කිරීමටත් බලපා ඇත.

## ව්‍යාපෘතියේ ප්‍රතිඵල

❖ වයඹ පළාත තුළ ප්‍රජා පාදක විශෝධන කාර්යාල 14කට අදාළව 2017 ජුනි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා ප්‍රජා පාදක විශෝධන නියෝග 825 ක් ලැබී තිබේ .මින් ආඥාලාභීන් 494 දෙනෙකු මත් නිවාරණ ප්‍රතිකාර සැලැස්මට ඇතුළත් කොට සායනික හා නේවාසික ප්‍රතිකාර සඳහා යොමු කොට ඇත. ප්‍රතිකාර සඳහා යොමු කරන ලද අඥාලාභීන් 494කුගෙන් මෙම ක්‍රියාවලිය සම්පූර්ණ කොට ඇති ආඥාලාභීන්ගෙන් 377 ක් මේ වන විට මත්ද්‍රව්‍ය භාවිතයෙන් ඉවත්වී ඇත. එසේ මත්ද්‍රව්‍ය භාවිතයෙන් ඉවත්වූ ආඥාලාභීන්ගේ ප්‍රතිශතය 76.3% ක් වන අතර එය මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵලයටත් වඩා ඉහළ අගයකි. වෛද්‍ය ප්‍රතිකාරවලින් අනතුරුව මනෝවිද්‍යාත්මක උපදේශනය, පවුල් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, වෘත්තීය පුහුණුව, අධ්‍යාපනික වැඩසටහන් සහ පෞරුෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ප්‍රජා විශෝධන නිලධාරීන්ගේත්, සංවර්ධන නිලධාරීන්ගේත් මැදිහත්කරණයෙන් පුද්ගලයාගේ අවශ්‍යතාවය අනුව සිදු කොට ඇත .

- සම්පූර්ණයෙන්ම මත්ද්‍රව්‍ය භාවිතයෙන් හෝ විකිණීමෙන් හෝ ඉවත් වූ පුද්ගලයන් සඳහා අවශ්‍යතාවය අනුව ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති 117ක් ක්‍රියාත්මක කොට ඇත . ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා සංවර්ධන නිලධාරී මගින් රුපියල් මිලියන 4.6 ක් ලබා දී ඇත.

- මේ සියළු ක්‍රියාකාරකම් තුළින් මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් මානසිකව මෙන්ම ආර්ථිකව හා සමාජයීය වශයෙන් දැඩි පසු බෑමකට ලක්ව තිබූ, තම පවුලට සහ සමාජයට හානිකර චර්යාවන්ගෙන් යුතු වූ මිනිසුන් නිවැරදි කරමින්, ඔවුන්ගේත් ඔවුන්ගේ ළබැඳියන්ගේත් මුහුණට සිනහවක් ගෙන එන්නට සහ නව බලාපොරොත්තුවක් ඇති කරන්නට ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවට හැකි වී තිබේ.






0503


## 3.0 ධාරිතා සංවර්ධනය

## 3.1 නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් හා පුහුණු කිරීමේ වැඩසටහන් (01.01.2017 -31.12.2017)

දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම එක් ප්‍රධාන පියවරයක් ලෙස හඳුනා ගත් අතර එසේ හඳුනා ගත් පුහුණු අවශ්‍යතා පදනම් කර ගනිමින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව ප්‍රජා විශෝධන නිළධාරීන්, වැඩ පරීක්ෂක වරුන් හා සංවර්ධන නිලධාරීන් සඳහා පහත පරිදි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර මීට අමතරව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ඇතුළු අධ්‍යයන ආයතන වෙත පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කරන ලදි.

## 3.2 2017 වර්ෂයේදී ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ නිලධාරින් වෙනුවෙන් පුහුණු වැඩ සටහන් සඳහා මුදල් ගෙවීම් කර ඇති ආකාරය.

| නිලධාරින් | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ස.කො | ජ්‍යෙ.ප්‍ර.වි.නි (පළාත්) | ප්‍ර.වි.නි | සංවර්ධන නිලධාරි | තොරතුරු තාක්ෂණ | රා.ක.ස | වැ.ප | ලිපිකරු | රියදුරු |
| වැඩ සටහන් සංඛ්‍යාව | 1 | 4 | 7 | 10 | 1 | 8 | 1 | 5 | 1 |
| වියදම් වූ මුදල රු. | 120,000/- | 588,167/- | 479,868/- | 489,061/- | 15000/- | 168,000/- | 1424,000/- | 54000.00 | 3000.00 |

මුලු එකතුව = රු.3,405,496.00

## ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම් - 2017

| ව්‍යාපෘති අංකය / නම, පුද්ගලික පඩිනඩි සහ සියළුම ව්‍යාපෘති සඳහා අනෙකුත් වියදම් | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම් | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම (4-5) |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පුද්ගල පඩිනඩි | 236,200,000 | | -2,715,000 | 233,485,000 | 229,524,811 | 3,960,189 |
| අනෙකුත් වියදම් | 23,129,000 | 4,510,000 | 2,715,000 | 30,354,000 | 26,729,470 | 3,624,530 |
| මුළු එකතුව | 259,329,000 | 4,510,000 | 0 | 263,839,000 | 256,254,281 | 7,584,719 |

## ව්‍යාපෘති අනුව මූලධන වියදම් - 2017

| වැය විෂය අංකය | අයිතම අංකය | මූලාශ්‍ර කරණය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම් | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම (4-5) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 2001 | | 11 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 600,000 | | | 600,000 | 58,560 | 541,440 |
| 2002 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 200,000 | | | 200,000 | 62,100 | 137,900 |
| 2003 | | 11 | වාහන | 200,000 | | | 200,000 | 76,437 | 123,563 |
| 2102 | | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 3,000,000 | | | 3,000,000 | 2,820,472 | 179,528 |
| 2103 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,000,000 | | | 1,000,000 | 934,139 | 65,861 |
| 2401 | | 11 | හැකියා වර්ධනය හා ආයතනික සංවර්ධනය | 5,000,000 | | | 5,000,000 | 3,202,854 | 1,797,146 |
| 2509 | | 11 | වෙනත් | 500,000 | | | 500,000 | 384,013 | 115,987 |
| | | | එකතුව | **10,500,000** | **0** | **0** | **10,500,000** | **7,538,575** | **2,961,425** |

## 4.0 ඉදිරි සැලසුම්

01. ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීම තුලින් ප්‍රජා පාදක විශෝධන ආඥා සංඛ්‍යාව ඉහල නැංවීම හා බන්ධනාගාර ගත වන සුළු වැරදිකරුවන් ප්‍රමාණය අවම කිරීම .

02. වරදට පෙළඹවීමට ඉඩ ඇති පුද්ගලයන් හදුනාගෙන ඔවුන් මුල් අවස්ථාවේදීම නිවැරදි කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වැඩසටහන් පැවැත්වීම.

02 ප්‍රජා විශෝධන නිලධාරීන් සඳහා ප්‍රජා විශෝධනය සම්බන්ධ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හඳුන්වාදීම.

04. සංවර්ධන නිලධාරීන් හරහා ප්‍රජා විශෝධන ආඥාලිභීන්ගේ පසු විපරම් ක්‍රියාවලිය විධිමත් කිරීම

05. නිලධාරින්ගේ ප්‍රගතිය ඇගයීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම.

06. මතට ඇබ්බැහි වූ සුළු වදරකරුවන් වරදින් මිදුණු යහපත් පුද්ගලයින් බවට පත් කිරීම හා ඔවුන්ගේ පවුල් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමේ ක්‍රමවේදයක් සකස් කිරීම

07. ප්‍රජා විශෝධන ආඥාලාභීන් සඳහා තොරතුරු කළමණාකරණ පද්ධතියක් සැකසීම

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

අංක 35ඒ

ආචාර්ය ඇන්.ඇම්.පෙරේරා මාවත

බොරැල්ල

කොළඹ 08

දුරකථන: 011-2683691

ෆැක්ස් : 011-2683675

ඊමේල් : dcbcorrection@gmail.com